සැකසීම: එම්.පී.ඩබ්.ආර්.මුතුගල
ර/ ගන්කන්ද මධ්‍ය විද්‍යාලය

## II වාරය

නිපුණතාව - 06 නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යනය කරමින් ජාතික උරුම රැකගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම - 6.4 විවිධ ප්‍රසංගයක් ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම - 6.4 සාමූහිකව විවිධ ප්‍රසංගයක් ඉදිරිපත් කරමු.

ඉගෙනුම් ඵල -

- විවිධ ප්‍රසංගය පැවැත්වීමේ අවශ්‍යතාව හා එහි වැදගත්කම විස්තර කරයි.
- විවිධ ප්‍රසංගය පැවැත්වෙන දිනය, තේමාව හා ස්ථානය නම් කරයි.
- තේමාවට අදාළ, ගායන, වාදන, නර්තන අංග තෝරයි.
- විවිධ ප්‍රසංගය සඳහා තෝරා ගත් අංග පෙළ ගස්වයි.
- ආරාධනා පත්‍ර සකස් කරයි.
- ආරාධනා පත්‍ර යැවීම සඳහා නාම ලේඛනයක් සකස් කරයි.
- ප්‍රචාරක කටයුතු, සැරසිලි, රංග උපකරණ, රංග වස්ත්‍රාභරණ, ආලෝකකරණය, තාක්ෂණික උපකරණ භාවිතය, අංග රචනය, සමරු තිළිණ නිර්මාණය, සංග්‍රහ කටයුතු ආදී වගකීම් කණ්ඩායම් අතර බෙදා ගනියි.
- දේශීය අනන්‍යතා ලක්ෂණ ආරක්ෂා වන පරිදි නර්තනය, ගායනය, වාදනය හා සැරසිලි අංග නිර්මාණ ප්‍රදර්ශනය කරයි.
- සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කරමින් සාමූහිකව විවිධ ප්‍රසංගය ඉදිරිපත් කරයි.

ශිෂ්‍යා කළයුතු කාර්යයන් -

- විවිධ ප්‍රසංගයක් සහිත දෘශ්‍ය පට නරඹන්න.

ඉහත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ඉගෙනුම් ආධාරක -

- 13 ශ්‍රේණිය නර්තන අතිරේක කියවීම් පොත
- **You Tube** නාලිකාව

ඇගයීම් -

- විවිධ ප්‍රසංගයක් සඳහා සුදුසු තේමාවක් නම් කරන්න.
- තෝරාගත් තේමාවට උචිත වන පරිදි නර්තනය, ගායනය, වාදනය අංග පෙළගස්වන්න.
- ප්‍රසංගයක් සාර්ථකව ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය මූලික තොරතුරු ඇතුළත් සැලසුමක් සකස් කරන්න.
- විවිධ ප්‍රසංගයක් සංවිධානය කර ඉදිරිපත් කිරීමෙන් ඔබ ලැබූ අත්දැකීම් විස්තර කරන්න.
- විවිධ ප්‍රසංගය පිළිබඳව ඔබේ අදහස් විචාරාත්මකව ඉදිරිපත් කරන්න.

පහත ඇගයීම් ද සිදුකරන්න.-

- සති පාසල් කාර්ය පත්‍රිකාව අංක 18 ස්වයං අධ්‍යාපනයට යොමුවන්න.

පසු ක්‍රියාකාරකම් -

- සාර්ථක අසාර්ථක භාවය පිළිබඳ සියලු දෙනාගේ අදහස් විමසන්න.
- උදව් උපකාර කළ අයට ස්තුතිය ප්‍රකාශ කරන්න.